• පහත ප්‍රවෘත්ති ප්‍රකාශය කාඩ්පතක පැහැදිලි ව ලියාගන්න.

ප්‍රවෘත්ති ප්‍රකාශය

ආයුබෝවන්

මේ කලණ ළමා රූපවාහිනී සේවය යි.

ප්‍රවෘත්ති ප්‍රකාශය

ඉදිරිපත් කිරීම . . . . . .

මුලින් ම සිරස්තල

♦ ජාතික මදුරු මර්දන සතියේ දී පාසල් පිරිසිදු කිරීමට පියවර ගනියි.

♦ ජල සම්පත රැක ගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගේ සහාය පතයි.

♦ ජාතික මදුරු මර්දන සතිය මාර්තු මස 29 දින සිට අප්‍රේල් මස 4 වැනිදා දක්වා පැවැත්වෙයි. මදුරු උවදුර රටපුරා වසංගතයක් වී ඇත.එබැවින් පාසල් සහ ඒ අවට පිරිසිදු කිරීම කඩිනමින් කළයුතු කාර්යයකි.ඒ සඳහා සිසුන් සහ දෙමවුපියන්ගේ සහාය ලබාගත යුතු බව අධ්‍යාපන අමාත්‍යාංශය දැනුම් දෙයි.

♦ මිනිසාගේ එදිනෙදා කටයුතුවලට අවශ්‍ය වන්නේ ජලය යි. මේ වන විට අප රටේ ජල සම්පත විනාශ වෙමින් පවතී. මෙම අයහපත් ප්‍රතිඵල විඳීමට සිදුවන්නේ අනාගත පරපුරට යි. ජල සම්පත විනාශ වීමට හේතු වන්නේ මිනිසාගේ අයහපත් ක්‍රියා ය. ගස් කැපීම, කළුගල් කැඩීම, වැලි ගොඩ දැමීම ඒ අතර ප්‍රධාන වෙයි. මෙවැනි අයහපත් ක්‍රියාමාර්ග වළක්වමින් ජල සම්පත රැක ගැනීමට දායක වන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගේ සහාය පතයි.

ප්‍රවෘත්ති සමාප්ත යි.

•

ආරණීය දුවේ,පුතේ....

- මධ්‍යම ප්‍රමාණයේ පෙට්ටියක් ගන්න එහි යටිපැත්ත කොටුව ස්වරූපයකින් කපා රූපවාහිනියක තිරය මෙන් සකසා ගන්න.
- ඔබේ සෙල්ලම් රූපවාහිනිය භාවිත කර ඉහත දැක්වෙන ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්න .
- ඉහත දැක්වෙන ප්‍රවෘත්ති මෙන් ඔබ කැමැති වෙනත් ප්‍රවෘත්ති සකස් කර ඉදිරිපත් කරන්න